# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ කළමනාකරණ සහකාර-තාක්ෂණ බණ්ඩ 2 (MT 2-2025) සේවා ගණයේ III ශ්‍රේණිය ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය-2026

සබරගමුව පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවෙහි ක්‍රීඩා නිලධාරී III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2026.02.12 දිනට වයස අවුරුදු 18 ට වැඩි සහ 35 ට නොවැඩි සුදුසුකම්ලත් සබරගමුව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය 2026 පෙබරවාරි මාසයේ දී පවත්වනු ලැබේ.

01. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :- 2026.02.12

02. පුරප්පාඩු සංඛ්‍යාව :- 05

03. බඳවා ගැනීමේ සුදුසුකම්:-

3.1 අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්

(අ)

I. මව්බස (සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාව), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම

**සහ**

II. අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගෙන තිබීම. (සාමාන්‍ය ඉංග්‍රීසි හා සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

**සහ**

III. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් මට්ටමින් (දිස්ත්‍රික් අතර) පැවැත්වෙන තරඟයන්හි දී 1 හෝ 2 ස්ථානයන් ලබා තිබීම, ජාතික මහා ක්‍රීඩා උළෙලේ 1, 2 හෝ 3 ස්ථාන ලබා තිබීම, ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරඟවල 1, 2 හෝ 3 ස්ථාන ලබා තිබීම.

**හෝ**

(ආ)

I. මව්බස (සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය සමත් වී තිබීම.

**සහ**

II. දකුණු ආසියාතික තරඟ, ආසියාතික තරඟ, පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟ, ලෝක ශූරතා තරඟ හෝ ඔලිම්පික් තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර තිබීම.

04. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

05. මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය:-

අංක 10/2025 හා 2025.03.25 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 2 (MT 2 - 2025) වැටුප් කාණ්ඩය MT - 02 - 2025 වන අතර මාසික වැටුප් පරිමාණය රු:50,630-10X630-11X670-10X1010-10X1190-රු. 86,300 වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද හිමි වේ.

06. ලිඛිත පරීක්ෂණයක් සහ වෘත්තීය පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එමගින් ලබා ගන්නා ප්‍රතිඵල අනුව අයදුම්කරුවන් විසින් ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාවය මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන ද අනුගමනය කරමින් කුසලතාවය පදනම් කර ගනිමින් පවත්නා පුරප්පාඩු ගණනට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ. ලිඛිත තරඟ විභාගයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත, බඳවා ගැනීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. වෘත්තීය පරීක්ෂණය සඳහා යොමු කළ අයදුම්කරුවන් සියලු දෙනා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

07. මෙම බඳවා ගැනීමේ සම්පූර්ණ නිවේදනය සහ ආදර්ශ අයදුම්පත්‍රය **www.sg.gov.lk** හා **www.pse.sg.gov.lk** යන වෙබ් අඩවිවල පළකර ඇත.

**ඩබ්.ආර්.දිනීෂා එස්.රත්නායක**
**ලේකම්,**
**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,**
**සබරගමුව පළාත.**
**2026.01.09**